30/08/2011 - දිනමිණ

**කොළඹ සුරපුරක් කරන මිලින්ද ප්‍රතිපත්තිය මේ සතියේ ප්‍රකාශයට**

මහින්ද චින්තනය පදනම් කර ගනිමින් කොළඹ නගරය කාර්යක්ෂම, යහ පාලනයකින් හෙබි පරමාදර්ශී නගරයක් බවට පත්කිරීම සඳහා වන සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය මේ සතියේ එළිදක්වන බව එ.ජ.නි.ස. කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා දිනමිණට පැවැසීය.

කොළඹ නගරය අලංකාර කිරීම සඳහා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විශේෂ කැපවීමකින් කටයුතු කරගෙන යන බවත් එය තවදුරටත් ඉදිරියටත් ගෙනයාම සඳහා තමා ද කැපවන බවත් මොරගොඩ මහතා කීවේය.

නගරය සංවර්ධිත අලංකාර පුරවරයක් බවට පත්කිරීම සඳහා නගරවැසි කිසිවකු පිට කිරීමට කිසිදු අදහසක් නැති බවත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ද ඒ බවට ප්‍රතිඥා දී තිබෙන බවත් අවධාරණය කළ පුරපති අපේක්ෂක මොරගොඩ මහතා පැල්පත් නිවාසවාසීන්ට තමන් වෙසෙන ස්ථානවලම පහසුකම් වලින් සපිරි තට්ටු නිවාස ඉදිකරදෙන බවත් පැවැසීය.

සෞඛ්‍යසම්පන්න ජනතාවක් වෙනුවෙන් පොදුජන සෞඛ්‍ය වැඩසටහන්, කොළඹට සුවිශේෂ ප්‍රවාහන වැඩපිළිවෙළක්, ජලපවහනය හා මලපවහනය සඳහා විශේෂ සැලැස්මක් සහ නාගරික ජනයා සඳහා ක්‍රීඩා පහසුකම් සංවර්ධනය ද තම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වැදගත් අංශ වත් මොරගොඩ මහතා කීය.

ඩෙංගු වැනි රෝග බෝවීම වැළැක්වීම සඳහා සෞඛ්‍යාරක්ෂාව පිණිස කටයුතු කරන බවද 1920දී පමණ අසූ දහසක ජනගහනයක් සඳහා ක්‍රියාත්මක කළ මලපවහන පද්ධතිය අදට ගැළපෙන පරිද සංවර්ධනය කළ යුතු බවද කොළඹ අද ජනගහනය ලක්ෂහයහමාරක් පමණ වන අතර දිනපතා රාජකාරිවලට පිටතින් පැමිණෙන පිරිසද ගත් විට දෛනික ජනගහණය දසලක්ෂය ඉක්මවන බැවින් ඔවුන් හැමදෙනා වෙනුවෙන්ම පහසුකම් සැලසීම මහ නගර සභාවට පැවැරෙන වගකීමක් බව තේරුම්ගෙන කටයුතුතු කරන බවද ඒම මහතා කීවේය.

කොළඹ නගර සභාව දශක කිහිපයකට පෙර ට්‍රොලිබස් රථ සේවයක් පවත්වාගෙන ගිය බැව් සිහිපත් කළ මොරගොඩ මහතා එම බස් රථ සේවාව නොවුණත් නාගරික ජනතාවට පහසුවෙන් ගමන්බිමන් යා හැකි ප්‍රවාහන පද්ධතියක් ගොඩනැගිය යුතුව ඇතැයි ද කීය.

නගරයේ ක්‍රීඩා පිටි හතළිස් හතක් පමණ තිබෙනවා. ඒවායින් බොහෝමයක් අද ක්‍රීඩාවට උචිත තත්ත්වයක නැහැ. පාපන්දු සඳහා කලකට පෙර රටේම ප්‍රසිද්ධ ක්‍රීඩා සමාජ තිබුණා.

අද ඒවා අකර්මණ්‍යයි. කොළඹ නගර සභාවේ ක්‍රිකට් කණ්ඩායමත් එදා ප්‍රසිද්ධවී තිබුණා.නගරවාසීන් ද ක්‍රීඩාවට කැමැතියි. ඒ නිසා ක්‍රීඩා අංශයෙහි සංවර්ධනය මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි වැදගත් තැනක් ගන්නවා යැයිද මොරගොඩ මහතා කීවේය.

නගර සංවර්ධනයට මෙන්ම පරපාලනයට ද අති විශාල මුදලක් කොළඹ මහ නගර සභාවට අවශ්‍යයි. එයින් කොටසක් බදු වශයෙන් ජනතාවගෙන් ලබාගන්නවා. තවත් කොටසක් පළාත් සභාව මගින් ආණ්ඩුවෙන් ලැබෙනවා. එහෙත් එය ප්‍රමාණවත් නොවන නිසා රජයේද ආධාරය ඇතිව සෘජුවම නගර සභාවට විදේශ ආධාර ලබා ගැනීම සඳහා කැපවෙනවා.

නගරයේ ජනතාව නගරයෙන් පිට කිරීම කොළඹ නගරයේ වෙළදාම මුල්කරගත් ආර්ථිකයට සෘජුවම බලපානවා. නගරයේ ජනතාව විවිධ ක්ෂේත්‍ර මගින් නගර ආර්ථිකයට බද්ධවී සිටිනවා.

මේ ජනතාවගේ උපරිම කාර්යක්ෂමතාවය උපයෝගී කර ගනිමින් විනිවිද පෙනෙන සහ පාලනයක් මගින් ආදර්ශවත් නගරයක් බිහිකිරීම පිණිස සියලු දෙනාගේම සහයෝගය මා ප්‍රාර්ථනා කරනවා යැයිද මොරගොඩ මහතා සඳහන් කෙළේය.